# පරවියන්ගල (ආදර කන්ද, පරෙයියන්ගල, පරෙයිගල) කඳු පන්තිය

**අප සංචාරයේ අරමුණ** :පරවියන්ගල තරණය, අපගේ ප්‍රථම වීඩියෝ වැඩසටහන නිර්මාණය කිරීම
**දිනය**: 2015 අගෝස්තු 15වන දින
**සහභාගී වූවන් ගණන**: 8යි (නිශාන් කුළසිංහ ,ලසිත රත්නායක ,අරුණ සුගතපාල, හර්ෂ වීරසිංහ, අමිල රණසිංහ, ශානක පුෂ්පපානි, සඳුන් පෙරේරා, තිසර මලිපුන්)
**ගමන් කල ආකාරය** :බදුල්ල- කොළඹ (99) පොදු ප්‍රවාහන බස් රථයකින්
**ඡයාරූප සහ වීඩියෝ**: නිශාන් කුළසිංහ
**විශේෂ ස්තූතිය**: ලක්දසුන් වෙබ් අඩවිය ඔස්සේ ගමනට මුල් අදහස ලබා දුන් අශාන් ගීගනගගේ සොහොයුරාට, ලසිත රත්නායක (GPS ගමන් මාර්ග සටහන්)
**මෙම වාර්තාව සැකසූයේ**: නිශාන් කුළසිංහ විසිනි

*(GPS ගමන් මාර්ගය (kml file) හා වීඩියෝ වැඩසටහන පහත යොමු වලින් ලබාගන්න)*

**කාරුණික ඉල්ලීමයි**

කරුණාකර ප්ලාස්ටික් ඇතුළු සියළු අපද්‍රව්‍යා මෙම ප්‍රදේශයට ගෙන ඒම සීමා කරන්න. ඒවා එම ප්‍රදේශයේ බැහැර නොකර ආපසු ගෙනවිත් නිසි ස්ථානයකදී පමණක් බැහැර කරන්න. මොනයම් ආකාරයේ හෝ ගිනි දැල්වීම් වලින් වලකින්න. ජල මාර්ග අපවිත්‍ර වන අයුරින් කටයුතු නොකරන්න. මත්පැන් පානය කර මෙම පරිසර පද්ධතියේ සංචාරය කිරීමෙන් වලකින්න. එය ඔබගේත් අන් අයගෙත් යහපත පිණිසම හේතු වනු ඇත. මේ පරිසර පද්ධතිය සියළුම ජීවී ප්‍රජාවගේ උරුමයකි. එය සුරකින්න, එයට ආදරය කරන්න. අපගෙන් පසුව එන ජීවී ප්‍රජාවටත් පරිසරය ආරක්ෂා කර තබන්න. මෙය "**ලක් විස්කම්**" ඔබගෙන් කරන කාරුණික ඉල්ලීමයි!

www.LakViskam.org

**කොළඹ සිට ගමන් මාර්ගය**

කොළඹ පිටකොටුව බස් නැවතුම> නුගේගොඩ (හයිලෙවල් මාර්ගය ඔස්සේ) > අවිස්සාවේල්ල >රත්නපුර > බලංගොඩ > පඹහින්න (177 km)> පරවියන්ගල කන්ද>(ආපසු පැමිණීම එම මාර්ගය ඔස්සේම)



**පරිසරය, ගමනේ ආරක්ෂාකාරී බව හා ස්වභාවය**

කන්දේ මුල් කොටස ෆයිනස් කැලෑවකින් යුක්තය. වර්ෂාව අඩු කාල වලදීද ජල මාර්ග ආශ්‍රිතව කූඩැල්ලන් ස්වල්ප වශයෙන් සිටී. කන්ද නැගීමේදී අතරමග එක් ස්ථානයක් හැරෙන්නට ජල මූලාශ්‍ර දක්නට නොමැත. කන්ද පුරා ඝනව වැඩුණු මානා තෘණ පඳුරු සහ අතරින් පතර කළු ගල් දක්නට ඇත. මෙම අඩි පාරේ සමහර ස්ථාන සුදු පැහැයෙන් යුක්ත වේ. එයට හේතුව තිරුවානා ගල් වන අතර මෙම තිරුවානා ගල් වලට පාද කැපී යාමට හැකි නිසා ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කල යුතුය. එසේම තෘණ පඳුරු වල සර්පයින්, ගෝනුස්සන් වැනි සතුන් ගැවසිය හැකි බැවින් හා ගල් වලින් තුවාල සිදුවීම වලක්වා ගැනීමට  පාද ආවරණය වනසේ හොඳ ඝර්ෂණයක් සහිත සපත්තු හා ඇඳුම් හැද පැළඳීම සුදුසුය. එසේම මෙම කන්දේ බොහෝ ස්ථාන තියුණු නැග්මකින් යුතු නිසා කන්ද නැගීම ඉතා වෙහෙසකර බවකින් හා අනතුරුදායක බවකින් යුක්තයි. ගමන ආරම්භක ස්ථානයේ සිට කඳු මුදුන් සතරටම ගමන් කර ආපසු පැමිණීමට සම්පූර්ණ දුර 10kmක් වේ. උසම කඳු මුදුන මුහුදු මට්ටමේ සිට මීටර් 1700කි. දැඩි අව් රශ්මිය හා වෙහෙසකර බව නිසාම එක් පුද්ගලයකුට ජලය ලීටර 2ක් පමණ  අවශ්‍ය වේ. එයද පාලනයක් ඇතිව පාවිච්චි කිරීම සුදුසුය. විශේෂයෙන් විජලන තත්වයන්ට ඔරොත්තු දීම සඳහා “ජීවනී” වැනි මිශ්‍රණයක් ජලය සමග මිශ්‍ර කර බීම සුදුසුය. සමහර අයට ඇති විය හැකි මස් පිඩු පෙරලීම වැනි දෑ අවම කර ගැනීමට ජීවනී පානය උපකාරී වේ.




පරවියන්ගල උස දක්වන ප්‍රස්ථාරය

විශේෂයෙන් සීග්‍ර නැග්මක් ස්ථාන පසු කිරීමේදී (නැගීමේදී හෝ බැසීමේදී)  තමන්ගේ දෙපා පිළිබඳව ඉතා හොඳ අවධානයකින් හා විශ්වාසයකින්  යුතුව කෙටි අඩි තැබීම වඩා සුදුසුය. අඩි පාරේ ඇති ගල් අතර බුරුල් වූ ගල් ඇති නිසා  සම්පූර්ණ ශරීර බර ගල් මතට ලබා දීමට පෙර පාදයෙන්ම ගල් බුරුල් නොමැති බවට තහවුරු කර ගන්න. එවැනි ස්ථාන වලදී කණ්ඩායමක් වශයන් ගමන් කිරීමේදී එකිනෙකා අතර පරතරයක් තබාගෙන ගමන් කිරීමත් ඉදිරියෙන් ගමන් කරන පුද්ගලයා නිසා ගල් ගැලවී පහලට පැමිණියහොත් පසු පසින් සිටින අය කලබල නොවී එය මග හැරීමටත් සූදානමින් සිටිය යුතුය. ප්‍රථමාධාර  සඳහා අවශ්‍ය මූලික බෙහෙත් ආදිය අනිවාර්යයෙන්ම ගෙන යා යුතුය. වැහි කබායක් ගෙන යාමටද අමතක නොකරන්න. මෙම කන්ද ඇතැම් අවස්ථා වලදී ඝන මී දුමෙන් සම්පූර්ණයෙන් වැසී ගොස් අතරමං විය හැකි නිසා ප්‍රවේශම් විය යුතුය. මැයි - අගෝස්තු කාලවලදී කන්ද මුදුනට

www.LakViskam.org

පුද්ගලයකු ගසාගෙන යන තරමට ප්‍රබල සැඩ සුළං වල බලපෑම එල්ලවිය හැක. එවැනි අවස්ථා ගැන දැඩි අවධානයකින් පසු විය යුතුය. අඳුර වැටීමට පෙර කන්දෙන් පහලට පැමිණීමද ඉතා වැදගත්ය.

**ගමන ආරම්භ කරමු**

වසරකට වැඩි කාලයක් මා විසින් විවිධ අවස්ථාවල ගත් උත්සාහයන් එල දරමින් පරවියන්ගල කන්ද තරණයට 8 දෙනෙකුගේ කණ්ඩායමක් සූදානම් කර ගන්නා ලදී. අගෝස්තු 15 වන සෙනසුරාදා අළුයම 2.40 ට පිටකොටුවෙන් පිටත්වන (99) බදුල්ල - කොළඹ බසයෙන් ගමන් ආරම්භ කල අප පඹහින්නෙන් උදෑසන 7ට බැස ගත්තෙමු. මහාමාර්ගය ඔස්සේ බදුල්ල දෙසට මීටර් 300ක් පමණ ඇවිදගෙන ගොස් විශාල වංගුවක් සමග වම් පසින් ඇතුලට විහිදෙන Interlock ගල් අල්ලන ලද කුඩා මාර්ගයකින් ඇතුල් වීකෙලින්ම ඇති මාර්ගයේ ඉහලට ගමන් කල යුතුය.



ගමන ආරම්භ වන කුඩා මාර්ගය



වනගත ආරාමය. වැසිකිලිය අසලින් දකුණට හැරෙන්න

www.LakViskam.org

කුඩා දොළ පහරක් හමුවන ස්ථානයකින් දකුණට හැරී කැලෑබද මාර්ගය ඔස්සේ දිගටම ගමන් කල විට වනගත භික්ෂු ආරාමයක් හමුවේ (මෙම ආරාමයේ භාවනායෝගීව වැඩවසන භික්ෂූන් වහන්සේට බාධා නොවන අයුරින් හැසිරීමට වග බලා ගන්න). එම ආරාමයට පසෙකින් දොළ පහරක් ගමන් කරන අතර වැසිකිලියක් අසලින් දකුණු පසට හැරී දිය පහර මතින් ෆයිනස් කැලෑවට ඇතුළු විය යුතුය. මෙතැන් සිට කන්ද මුදුන දක්වාම අඩි පාර දක්නට ඇති අතර ඒ ඔස්සේ මග පෙන්වන්නකු නොමැතිව වුවද කන්දට ගමන් කල හැක. පයිනස් කැලෑව අවසන් වන ස්ථානයේදී උදෑසන ආහාරය ගත් අප මද විවේකයක් ලබා ගත්තෙමු.



දොළ පහර පසු කර ෆයිනස් කැලෑවට



ෆයිනස් කැලෑව

අප කණ්ඩායමේ සිව් දෙනෙකුට මෙය සිය ප්‍රථම කඳු නැගීම වූ නිසා ගමන මදක් හෙමින් සිදු විය. මෙම කන්දට නිල වශයෙන් පරවියන්ගල යන නාමය භාවිතා කළත් විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව අතර භාවිතා වන්නේ "ආදර කන්ද" යන නාමයයි. පරෙයියන්ගල, පරෙයිගල යන නාමයන්ද මෙම කන්දට භාවිතා කර ඇත. විශේෂයෙන් සබරගමුව විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙම කන්ද නැගීම පීය වශයෙන් සිදු කරයි. හන්තාන කන්ද මෙන් ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්ව විද්‍යාල සිසුන්ද මෙය තරණයට නැඹුරුවක් දක්වයි. මෙම කන්දේ තවත් විශේෂත්වයක් නම් පයිනස් කැලෑවෙන් පසු කොටස බොහෝ විට එළිමහන් වටපිටාවක් වන අතර, අතරින් පතර අලුතින් වැඩිගෙන එන පයිනස් ගස් දක්නට ඇත. එළිමහන් තෘණ භූමිය මතින් ගමන් කරන විට අවට පරිසරයේ සුන්දරත්වය මනාව දිස් වේ. නිරිතදිග දෙසින් භාවාගල කන්ද, දකුණුදිග දෙසින් සමනල වැව ජලාශය, සබරගමුව විශ්ව විද්‍යාලය, වලවේ ගං මිටියාවත හා ගිනිකොණදිග දෙසින් කුරගල ප්‍රදේශය ඒ අතරින් ප්‍රධාන වේ. අතරමගදී කඳවුරු බැඳීමට සුදුසු ස්ථානයක් හමුවන අතර ඊට නුදුරින් කන්ද පහලට විහිදී යන පටු වනාන්තර තීරුවක් තුලින් කුඩා ජල පහරක්ද කන්ද පහලට ගලා යයි. ඔබට හමුවන අවසාන ජල මූලාශ්‍රය මෙයයි.



අවට සුන්දරත්වය හා තරමක් අපහසු නැග්ම



තිරුවානා ගල් සහිත සේදී ගිය අඩි පාර

www.LakViskam.org

මෙසේ තියුණු නැග්මන් සහිත ප්‍රදේශ පසු කරමින් මද විවේකයන් ලබා ගනිමින් දහවල් 11.15 වන විට "ආදර කන්ද" කළු ගල් පර්වතයට ලඟා වීමට අපට පැය 4ක් පමණ ගත විය. මුහුදු මට්ටමේ සිට එම ස්ථානයේ උස මීටර් 1451ක් ලෙස අපගේ චන්ද්‍රිකා GPS උපකරණයේ සටහන් විය. මෙම පර්වතය මත සිට ගත්විට අවට දර්ශන තල මැනවින් දැක ගත හැකි විය. කලින් සඳහන් කල දර්ශන තල වලට අමතරව මෙම කඳු පන්තියේ මුදුනත් බලතොඩුව කන්ද දෙසට විහිදී යන අකාරය මනාව දර්ශනය වන්නට විය. පරවියන්ගල කඳු පන්තියේ ප්‍රධාන කඳු මුදුන් සතරක් ඊසානදිගින් පිහිටා ඇති බඹරකන්ද දෙසට වන්නට ඇති බලතොඩුව, ගොම්මෝලි කඳු වලට එකට සම්බන්ධව පිහිටා ඇත. මෙම කඳු මුදුන් සහ ඝන වනාන්තරය මනාව දැක බලාගත හැකි අතර වයඹදිග දෙසින් මහඑළිය (හෝර්ටන් තැන්න) අයත් ඉතා උස් කඳු ප්‍රදේශය මැනවින් දර්ශනය වේ. මෙම කඳු අතරින් කිරිකැටි ඔය ද ගලා බසී.



අංශක 75ක පමණ ආනතියකින් යුත් දුෂ්කර නැග්මක්



පරවියන්ගල මත සෙල්ෆි සමූහ ජායාරූපය

එම අවස්ථාවේ ඉතා පැහැදිලි කාලගුණ තත්වයක් පැවතුනත් හෝර්ටන් තැන්න ඇතුළු එම කඳු වල ඉහල කොටස මීදුමින් වැසී තිබූ නිසා මා ඉතා ආශාවෙන් පසු වූ ලෝකාන්තය සහ එහි නැරඹුම් ස්ථානය, පරවියන්ගල මත සිට ජායාරූප ගත කර ගැනීමට නොහැකි විය. රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ මැතිවරණ කොට්ඨාශයට අයත් නන්පේරියල් වතු යායත් එහි තේ කර්මාන්ත ශාලා ගොඩනැගිලිත් මනාව දර්ශනය විය. එසේම නැග්රැක් වත්ත සහ ඒ ඔස්සේ දිවෙන මාර්ගයද හොඳින් දැක ගැනීමට ලැබිණි.



සමනල වැව, සබරගමු විශ්ව විද්‍යාලය



නන්පේරියල් හා මීදුමෙන් වැසී ඇති ලෝකාන්තය

www.LakViskam.org

විනාඩි 45ක් පමණ පරවියන්ගල මත කාලය ගත කල අප කඳු පන්තියේ ඉතිරි කඳු මුදුන් වෙත යාමට පිටත් වුනෙමු. මේ අතර වර්ෂාවක පෙර නිමිති ක්‍රමයෙන් පහල වන්නට විය. මීළඟ කඳු මුදුනෙන් පසු හමු වන්නේ තරමක් පටු ස්වභාවයකින් යුත් දෙපැත්තෙන්ම දළ බෑවුම් සහිත සුළං කපොල්ලකි. එදින එහි තද සුළඟක් නොවුයෙන් එම ස්ථානය පසු කල අප තියුණු නැග්මකින් පසු ක්‍රමයෙන් තෙවැනි කඳු මුදුනටද ලඟා විය.


සුළං කපොල්ල පසුකරමින්


කඳු පන්තියේ අවසානය දැක්වෙන කොඩිය?

අපගේ නවක සගයින් එම කඳු මුදුනේ විවේක ගන්නා අතරේ අරුණ, සඳුන්, ලසිත සහ මම ඉතිරි කඳු මුදුනත් තරණය කිරීමට පිටත් විය. වන ලැහැබක් තුලින් විහිදී ඇති අඩි පාර ඔස්සේ ගමන් කර අවසාන කඳු මුදුනටද පිවිසුනෙමු. එයින් සෑහීමකට පත් නොවූ අප මෙම කඳු පන්තියෙන් ඔබ්බට තවදුරටත් ගමන් කළෙමු. රතු පැහැති කොඩියකින් දක්වා තිබු පරවියන්ගල සීමාව පසුකර බලතොඩුව කන්ද දෙසට දිවෙන වෙනත් කන්දක් වෙත පිය නැගුවෙමු. මේ අවස්ථාවේදී මීදුම අප සිටින කඳු ක්‍රමයෙන් වසා ගන්නට විය. වැහි වලාකුළින් බරවූ අහස ගිගුරුම් දෙන්නට විය. මල් තුහීනද ඇද හැලෙන්නට විය. ලසිත තවමත් අප සිටි කඳු මුදුනට සෙමෙන් ළඟා වෙමින් සිටි නිසා අප තිදෙනා ඝන වනාන්තරය තුලින් බලතොඩුව දෙසට ඇති මීළඟ කඳු මුදුනත් ජයගැනීමේ අදහසින් පිටත් වුනෙමු.

www.LakViskam.org


මීළඟ කඳුමුදුනට යාමට පෙර


වර්ෂාව නිසා ගමන අත්හැර ආපසු පැමිණෙමින්

වනාන්තරය තුලින් ටික දුරක් ගිය අපට ගමන සාර්ථක නොවන බව හැඟී ගියේ අහස ගිගුම් දෙන්නට වීමත්, පොද වැස්සක් ඇද හැලෙන්නට වීමත් හා මීදුම කැලෑව වසා ගන්නට වීමත් නිසාය. ප.ව. 1.15ට පමණ ගමන අත්හැර ආපසු පෙර කඳු මුදුනට පැමිණි විට පොද වැස්ස ක්‍රමයෙන් වැඩි වන්නට විය. අප සිව්දෙනා හැකි ඉක්මනින් ආපසු අප සගයන් රැඳී සිටින කඳු මුදුන වෙත ගමන් කලෙමු. මේ අතරතුර වර්ෂාව තදින් ඇද හැලෙන්නට විය. වැහි කබා වලින් ආරක්ෂා වූවත් තෙත බරිත වූ  අප සගයන් සිටි කඳු මුදුනට ළගාවත්ම වර්ෂාව මදක් සමනය විය. ආහාර ගනිමින් මද වේලාවක් එහි ගත කරන විට නැවත වර්ෂාවක පෙර නිමිති පහළවිය. ප.ව. 2.00ට කන්දෙන් බැසීම ආරම්භ කල අපට අතරමගදී නැවත තද වර්ෂාවකට හා සීතල සුළගට මැදිවන්නට සිදු විය. ඉතා සෙමින් හා සීරුවෙන් කන්ද බැසීම සිදුකල අපට අමිල සහෝදරයාගේ දණහිසේ ආබාධයක් හටගත් නිසා වැස්සේ තෙමෙමින් ඔහුට බැසීමට උදව් දෙමින් ඉතාමත් සෙමින් කන්ද බැසීමට සිදු විය. මේ අනපේක්ෂිත සිදුවීම සහ විටින් විට හටගත් තද වැස්ස නිසා අපට සීග්‍ර බෑවුම් වලින් පහලට බැසීමට නොසිතු විරු වෙලාවක් ගත විය.



මා හට දෂ්ඨ කිරීමට උත්සහා කල ගෝනුස්සෙකු



වැස්ස දිය ඇල්ලකට පන ලබා දී...

අප කන්ද නගිද්දී දක්නට නොවූ දිය ඇලි වර්ෂාව නිසා නිර්මාණය වී පරිසරයට අමුතුම අලංකාරයක් එක් කර තිබුණි. සබරගමු විශ්ව විද්‍යාලය හා සමනල වැව ජලාශයට ඉහලින් ඉතා ඈතින් වූ කන්දක වනාන්තරයක් තුලින් කලින් අප ඇස නොගැටුණු ඉතා අලංකාර දිය ඇල්ලක් දැක අප සියලු දෙනාම පුදුමයට පත් වීමු. එය ඉතා උසින් හා පළලින් යුතු විශාල ඇල්ලක් බව බැලු බැල්මට පෙනිණි. මාගේ කැමරාවට පින් සිදු වන්නට zoomකර ලබා ගත් ඡායාරූප පෙළක් පසුව පිරික්සීමේදී  එය දිය ඇල්ලක් නොව ජලය වැටී දිලිසෙන මාර්ගයක් බවට හදුනා ගන්නා ලදී.



අපව මුළා කල දිය ඇල්ල



සත්‍යය පසක් වී... දිලිසෙන මාර්ගය

www.LakViskam.org

වැස්සට තෙත බරිත වූ සපත්තු හා ඇඳුම් බොහෝ වෙලාවක් හැද පැළද ගෙන සිටීම නිසා ශරීරය හා කකුල් තැම්බී සුදුමැලි වී තිබිණ. අප වනගත ආරාමය අසල දොළ පාර පසු කරන විට කළුවර වැටෙමින් තිබිණ. ඉතිරි කොටස පසු කරමින් සිටියදී තද අඳුර හා තද වර්ෂාවට මැදි වී රාත්‍රී 7.00 වනවිට බදුල්ල-කොළඹ මහා මාර්ගය වෙත ළඟා වුනෙමු. දහවල් ආහාරයවත් හරි හැටි නොලැබුණු අප කොළඹ බසයකට ගොඩ වී නිවෙස් බලා පිටත් වුනෙමු. පැය 12ක වෙහෙසකර පා ගමනකින් පසුව කිසිදු කරදරයකින් තොරව නිවෙස් බලා යාමට සියලු අප දෙනාටම හැකි විය. එදින ලබා ගත් අත්දැකීම් වලින් ප්‍රබෝධමත් වූ අප සියළුම දෙනා මීළඟ අභියෝගය ජය ගැනීමට පුලපුලා බලා සිටින්නෙමු.

**අතිරේක යොමු**

අප සංචාරයේ තවත් ඡායාරූප එකතුවක් පහත යොමුවෙන් නරඹන්න.
https://picasaweb.google.com/102500057347588371605/ParaviyangalaMountain

එම සංචාරයේ වීඩියෝ වැඩසටහන YouTube ඔස්සේ පහත යොමුවෙන් නරඹන්න.
https://youtu.be/R6zkjsdc71g

අප ගමන් අඩිපාරේ GPS සටහන (kml) පහත යොමුවෙන් ලබා ගන්න.

http://www.lakviskam.org/resources.html

---

මෙම වාර්තාවේ අයිතිය “ලක් විස්කම්”වෙබ් අඩවිය සතුය.©www.lakviskam.org (2015 අගෝස්තු 29)
විමසීම් සහ අදහස් :lakviskam@gmail.com

www.LakViskam.org